**නුවරඑළිය මහා නගර සභාව - 2013**

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජූනි 02 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ඔක්තෝබර් 21 දින නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය.

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව මහා නගර සභාව සතු බහුකාර්ය ගොඩනැගිල්ල හැර අනෙකුත් වත්කම් ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී මිලදීගත්, රු.1,612,270ක් වටිනා වත්කම් විෂයයන් ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.6,904,300ක කර්මාන්ත ණයගැති ශේෂයක් හා රු.4,599,216ක කර්මාන්ත ණයහිමි ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඇ). රු.992,624ක් වටිනාකමැති ජංගම වැසිකිළි 09ක් හා නිල නිවාසවලට නිකුත් කර තිබූ ගෘහ භාණ්ඩ හා උපකරණ 85ක වටිනාකම වත්කම් යටතේ ගිණුම්ගතකර නොතිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩාවේ පැවති රු.1,350,816ක් වටිනා පොදු ගබඩා භාණ්ඩ තොගයක් ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබීම නිසා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ වත්කම් වෙන්දේසි කිරීමෙන් ලැබූ ආදායම රු.344,055ක් වුවද, එය රු.260,453ක් ලෙස වැඩසටහන් ආදායමට බැරකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.83,596ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ). මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම්වල දක්වා ඇති සේවක ණය ලැබීම් හා සේවක ණය ගෙවීම් පිළිවෙලින් රු.12,069,958ක් හා 16,014,566ක් වුවද, ගිණුම සමඟ ඉදිරිපත් කළ උපලේඛනය අනුව එම වටිනාකම පිළිවෙලින් රු.11,309,707ක් හා 12,254,316ක් වූයෙන් ණයලැබීම්වල රු.760,251ක් හා ණය ගෙවීම්වල රු.3,760,250ක වෙනසක් විය.

(උ). සමාලෝචිත වර්ෂය තුළ ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කළ රු.3,000,000ක් මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් අත්හැරී තිබුණි.

(ඉ). මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල් ප්‍රවාහයේ ලැබීම් යටතේ දක්වා ආදායම්වල රු.12,334,154ක විචලනයක් නිරීක්ෂණය විය.

(එ). සමාලෝචිත වර්ෂය තුළදී සභාවේ විවිධ වැඩසටහන් සඳහා ආසියානු පදනම මගින් ලැබී තිබුණු රු.995,000කින් රු.467,000ක් පමණක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.528,000ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ). ඉකුත් වර්ෂයේ ණයගැති ප්‍රතිපාදන වෙන්කිරීමේදී වැඩියෙන් වෙන්කළ රු.169,758ක ණයගැති වටිනාකමක් ශේෂය තුළ ඇතුළත් බැවින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඔ). ඉකුත් වර්ෂයට අදාළව රු.35,312ක හා සමාලෝචිත වර්ෂයට අදාළ රු.2,174ක් වූ රථවාහන නවතා තැබීමේ ගාස්තු ආදායම පොදු තැන්පත් යටතේ දක්වා තිබුණි.

(ඕ). සමාලෝචිත වර්ෂයට අදාළ රු.10,848,350ක් වූ සභාවේ වත්කම් බදුදීමේ ටෙන්ඩර් වටිනාකම වර්ෂයට අදාළ ආදායම රු.8,912,322ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.1,936,028ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්.
-----------------------------

ගිණුම් විෂයයන් 02කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.19,610,538ක් වූ අතර, උපයෝගී ලේඛණ, අනුව එම ගිණුම්වල ශේෂයන්ගේ එකතුව රු.23,095,737ක් වූයෙන් රු.3,485,199ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ගෙවිය යුතු ගිණුම්
---------------------

2013 දෙසැම්බර් 31 දිනට අවු.01ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.31,968,977ක් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.
-----------------------------------

i. 2013 ජනවාරි සිට මාර්තු දක්වා රු.581,127ක් වටිනා ගෙවීම් වවුචර්පත් 17ක් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

ii. මහා නගර සභාවේ නිලධාරීන් හා සේවකයින් සඳහා රු.383,121ක් වැයකර මිලදීගත් පාවහන් 193න් 100ක් සෞඛ්‍ය අංශයේ රියදුරු, කංකාණි සහ කම්කරුවන් සඳහා නිකුත් කර තිබුණද, අදාළ සේවකයින් ලබාගත් බවට අත්සන් ලේඛණ නොතිබුණි.

1.3.5 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.
-----------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ). | 1988 මහා නගර සභා ආඥාපනත | |
| | i. 40 (1) ඊ උපවගන්තිය | මහා නගර සභාව සතු ඉඩම් පළාත් පාලන විෂයභාර ඇමතිවරයාගේ හා ජනාධිපතිතුමාගේ අනුමැතියකින් හා බදු ගිවිසුමකින් තොරව අනවසරයෙන් භුක්ති විඳින අතර මෙම ඉඩම් සම්බන්ධයෙන් ලබාගත් තක්සේරු වාර්තා අවුරුදු 05කට වරක් යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ). | ඉඩම් ආඥාපනත හා ජනාධිපතිතුමාගේ 1995 ජූලි 14 දිනැති අංක (SEI/A/4/34) දරන චක්‍රලේඛයේ 07 ඡේදය | මහා නගර සභා සීමාව තුල වාණිජමය පදනමින් ලබාදුන් ඉඩම්වල බදු මුදල් වසර 05කට වරක් 50%ක් වැඩිකර සංශෝධනය නොවීම නිසා ඉඩම් 03ක් බදුදීම් වෙනුවෙන් රු.4,217,687ක පමණ බදු ආදායමක් මහා නගර සභා අරමුදලට අහිමිවී තිබුණි. |
| (ඇ). | මෝටර් රථ ප්‍රවාහන පනත (203 අධිකාරය) (19) (අ)(1) වගන්තිය | මොටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අනුමැතිය ලබා නොගෙන රු.125,000ක් වැයකර සභාව සතු ජීප් රථයක වර්ණය වෙනස් කර තිබුණි. |
| (ඈ). | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | i. 571 | තැන්පත් කර වසර 02ක් ඉක්මවූ වටිනාකම රු.4,817,098ක් වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු සිදුකර නොතිබුණි. |
| | ii. 751 | ප්‍රජා සංවර්ධන ඒකකයට මිලදීගෙන තිබූ රු.310,060ක් වූ කාර්යාල උපකරණ ඉන්වෙන්ට්‍රි ගතකර නොතිබුණි. |
| | iii. 1645 (අ) | වාහන අනතුරු 06ක් සම්බන්ධයෙන් ලොග් පොත්වල සටහන් තබා නොතිබුණි. |
| (ඉ). | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තිය | රු.1,612,270ක මුදලක් වැයවී තිබූ සභාවේ නව ගොඩනැගිල්ලේ සමරු ඵලක, නාමපුවරු සහ බිත්ති අලංකරණ ඡායාරූප වෙනුවෙන් සභාව මිල ගණන් 03ක් පමණක් ලබාගෙන තිබූ බව විගණනයේදී අනාවරණය වුණි. |
| (ඊ). | ආයතන සංග්‍රහය XXIV පරිච්ඡේදයේ<br>4:5 වගන්තිය<br>4:6 වගන්තිය<br>12,10 වගන්තිය | නගර සභාවේ සේවයේ නියුක්තව සිටි නිලධාරීන් 40දෙනකුට ලබාදී තිබූ උත්සව, විශේෂ අත්තිකාරම් මුදල් සහ ආපදා ණය මුදලින් රු.823,503ක ණය මුදලක් විවිධ හේතූන් මත අයකරගත නොහැකිව තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල.

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.104,745,298ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.121,.868,017ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය සමඟ සැසඳීමේදී රු.17,122,720ක අඩුවීමක් විය.

සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණය වශයෙන් රු.100,194,003ක් ලැබී තිබුණ නමුත් වැටුප් හා දීමනා ලෙස රු.109,101,952ක් ගෙවා තිබුණි. ඒ අනුව සභාවේ ආදායමින් රු.8,907,949ක මුදලක් සභා සේවකයින්ට වැටුප් ගෙවීමට වැය කරන බව නිරීක්ෂණය වන අතර එම මුදල වැටුප් ප්‍රතිපූර්ණය සඳහා සභාවේ පුනරාවර්තන ආදායමින් සියයට 4.25ක අගයක් විය.

2.3. ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය.

----------------------------------------

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2013.01.01 දිනට හිඟය | 2013.01.01 දිනට හිඟයෙන් අයකිරීම | 2013 වර්ෂයේ බිල්කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2013.12.31 දිනට හිඟ<br>2013.01.01 දිනට පැවති හිඟ | 2013.12.31 දිනට හිඟ<br>වර්ෂයේ බිල්කිරීම් වලින් | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 59,941,665 | 14,857,205 | 38,687,596 | 17,396,153 | 45,084,460 | 21,291,443 | 66,375,903 |
| බදු කුලී | 27,523,191 | 4,116,529 | 22,817,869 | 13,688,685 | 23,406,662 | 9,129,184 | 32,535,846 |
| බලපත්‍ර ගාස්තු | 1,187,500 | 693,500 | 8,120,521 | 7,694,021 | 494,000 | 426,500 | 920,500 |
| ජල ගාස්තු | 17,697,274 | 10,714,351 | 39,173,714 | 27,265,451 | 6,982,923 | 11,908,263 | 18,891,186 |
| එකතුව | 106,349,630 | 30,381,585 | 108,799,700 | 66,044,310 | 75,968,045 | 42,755,390 | 118,723,435 |

2.3.2 වරිපනම් බදු

--------------

(අ) 2012 වර්ෂයේ අයවැය ලේඛණය අනුව වරිපනම් බදු යටතේ ඇස්තමේන්තු කර තිබූ ආදායම රු.42,000,000ක් විය. 2013 වර්ෂයේ 36,000,000 ක් අඩුවෙන් ඇස්තමේන්තු කිරීමට හේතු විගණනයේදී අනාවරණය නොවුණි.

(ආ) ශ්‍රී පියතිස්සපුර පාර පිහිටි දේපළක 2005 අගෝස්තු 09 වන විට පැවති රු.24,299ක වරිපනම් බදු හිඟය හේතුවෙන් තහනම් කරන ලද ශීතකරණය, රූපවාහිනිය සහ ව්‍යායාම කට්ටලය දේපළ හිමිකරු විසින්

කිසිදු ගෙවීමක් කර නොතිබියදි අයිතිකරුට ආපසු භාර දී තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට රු.72,606ක වරිපනම් බදු මුදලක්ද එම දේපළ හිමිකරුගෙන් අයවිය යුතුව තිබුණි.

2.3.3 බදු කුලී
--------
සභාවේ දීර්ඝකාලීන හා වාර්ෂික බදු පදනම මත ලබාදුන් ඉඩම්වල ලිපිගොනු නඩත්තු කිරීමේ අවිධිමත් භාවය, පරිපාලනයේ අකාර්යක්ෂමතාවය, අධීක්ෂණයක් නොමැතිවීම හා බදුකරුවන් වෙත දැනුම්දී බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දින වන විට රු.7,567,838ක බදු ආදායමක් හිඟව පැවතුණි.

2.3.4 බලපත්‍ර ගාස්තු
---------------
සභාවේ අතුරු ව්‍යවස්ථා ගැසට් නිවේදනය අනුව සංචාරක සංවර්ධන පනත යටතේ ලියාපදිංචි ආයතනවලින් මාර්තු 31 දිනට පෙර බලපත්‍ර ගාස්තු අයකළ යුතු වුවත්, සංචාරක සංවර්ධන අධිකාරියේ නිල වෙබ් අඩවියේ නුවරඑළිය නගර සීමාව තුළ ලියාපදිංචි ආයතන 09කින් අතුරු ව්‍යවස්ථා පරිදි ගාස්තු අයකර නොතිබුණි.

2.3.5 ජල ගාස්තු
-------------

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති හිඟ හිටි ජලගාස්තු ශේෂය තුළ ජලය විසන්ධි කර වර්ෂයක් ඉක්මව ඇති අය නොවී පවතින ජල සේවා 104කට අදාළ රු.4,418,317ක මුදලක් පැවති අතර මෙම මුදල් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

2.3.6 ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු
--------------------------------
සභාවේ ආදායම් පරීක්ෂකවරුන් විසින් නගර සභා බලප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති ප්‍රචාරක දැන්වීම් පුවරු පරීක්ෂාවේදී හඳුනාගත් දැන්වීම් පුවරු 34කින් මහා නගර සභා අතුරු ව්‍යවස්ථා පරිදි අයවිය යුතු රු.1,901,100ක මුදල අයකර ගැනීමට 2013 ජුලි 08 දින වන විටද කටයුතු කර නොතිබුණි.

2.3.7. ග්‍රෙගරි වැවේ බෝට්ටු සේවාව.
---------------------------------
(අ) නුවරඑළිය ග්‍රෙගරි වැවේ බෝට්ටු සේවා පවත්වාගෙන යාම වෙනුවෙන් 2013 ඔක්තෝබර් 10 දින වනවිට රු.901,867ක මුදලක් අයකර නොතිබුණි. ග්‍රෙගරි වැවේ බෝට්ටු 2013 ඔක්තෝබර් 14 දින භෞතිකව පරීක්ෂා කිරීමේදී සභාවෙන් ආදායම් අයකරන බෝට්ටු 67 ක ප්‍රමාණයට වඩා වැඩියෙන් බෝට්ටු 14 ක් සේවයේ යොදවා තිබූ අතර එම බෝට්ටුවලින් වාර්ෂිකව රු.421,575ක ආදායමක් අහිමිවී තිබුණි. ඊට අතිරේකව අනවසර බෝට්ටු සේවාවක් පවත්වාගෙන යන බෝට්ටු හිමියෙකුගෙන් 2013 වර්ෂයට අදාළව රු.114,975ක ආදායමක් අයකරගත යුතුව තිබුණි. කිසිදු බෝට්ටු හිමියකු සමග සභාව ගිවිසුම් වලට එළඹ නොතිබුණි.

(ආ). ග්‍රෙගරි වැවේ සාජ් නිවාස බෝට්ටු සේවාව පවත්වාගෙන යනු ලබන පුද්ගලික සමාගම සමඟ එළඹ තිබූ ගිවිසුම අනුව රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත ගාස්තු අයකිරීමට කටයුතු නොකර, 2012 වර්ෂයේදී දිනකට රු.400බැගින් වසරකට රු.140,000ක ගාස්තුවකට සියයට 5ක් වැඩිකර 2013 වර්ෂයට බදු අයකර තිබුණි.

2.3.8 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේක්මවරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 41,489 |
| මුද්දර ගාස්තු | 10,637,667 |
| | ------------- |
| එකතුව | 10,679,156 |
| | ======== |

2.3.9 බඹරකැලේ ගල්වල බදුදීම

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බඹරකැලේ පිහිටි සභාව සතු ගල්වල බදු වශයෙන් 2013 දෙසැම්බර් 31 දිනට හිඟ බදු කුලිය වූ රු.630,000ක බදු මුදල අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ස්වාභාවික සම්පත් උකහාගැනීමේ අයිතිය බදු දෙනු ලබන්නේ අදාළ සම්පත් ප්‍රයෝජනයට ගන්නා ඒකක ප්‍රමාණය මත වුවද, ගල්වල බදුදීමේ ගිවිසුම අනුව වාර්ෂික බදු මුදලකට ලබාදීම තුළින් බදු ගැණුම්කරුට අසීමිත ප්‍රමාණයක් උකහාගැනීමේ අවස්ථාව උදාකරදී තිබූ අතර එය රජයේ සම්පත් අයථා පරිහරණයකට ඉඩ සැලසීමක් බව විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(ඇ) බදු ගැනුම්කරු සමඟ එළඹී ගිවිසුමේ කොන්දේසි අනුව බදු දීමනාකාර පක්ෂයේ පූර්ව ලිඛිත අවසරයක් නොමැතිව අනවසර ඉදිකිරීම් කර තිබූ අතර, ගිවිසුම් ප්‍රකාරව නගර සභාවට මෙම ගල්වල පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) බඹරකැලේ පිහිටි සභාව සතු ගල්වලෙන් නගර සභාවට ගල් සැපයීමේදී සාමාන්‍ය විකුණන මිලට වඩා සියයට 20කින් අඩුකොට සැපයිය යුතුය. නගර සභාවට 2011,2012 වර්ෂවල රු.1,648,950ක් වටිනා ගල්, මැටල් හා ගල්කුඩු පරිබාහිර ආයතනවලින් ලබාගෙන ඇති බැවින් නගර සභා අරමුදලට මෙම වර්ෂ දෙක තුළ පමණක් රු.329,790ක පාඩුවක් සිදුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යය සාධනය ඇගයීම

----------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවීම තහවුරු කරගැනීම සඳහා භෞතික හා මූල්‍ය කාර්යය සාධනය දැක්වෙන ප්‍රගති වාර්තා හා පාලන වාර්තා පිළියෙල කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

----------------------------------

නගර සභාවේ අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා ඇතැම් ක්ෂේත්‍ර සඳහා අනියම්, ආදේශක හා දෛනික වැටුප් මත සේවකයින් බඳවාගැනීම නිසා සේවකයින් 178ක අතිරික්තයක් නිරීක්ෂණය වූ තර මෙම සේවකයන් සඳහා 2014 ජනවාරි, පෙබරවාරි මාස දෙකෙහිදී වැටුප් ගෙවීමට රු.6,715,599ක මුදලක් වැයවී තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

(අ). සභාව සතු වාහන 09කට අදාළව වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගැනීමට වර්ෂ ගණනාවක්ම කටයුතු කර නොතිබූ අතර ඉන් වාහන 03ක් නගර සභාවට ලැබුණු දිනයේ සිටම වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ආ). මහා නගර සභාව විසින් 2013 වර්ෂයේ රු.51,922,189ක මුදලක් වැයකර නගර සභා බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩකාමර 16 ඉදිකිරීම් නිමකර 2013 සැප්තැම්බර් 16 දින සභාව වෙත භාරදී තිබුණද, විගණන දිනය වූ 2014 ජුනි 01 දින දක්වාම වසා දමා තිබුණි.

(ඇ). සභාවේ විවිධ කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ආසියානු පදනම මගින් සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණ රු.995,000කින් රු.373,283ක මුදලක් ප්‍රයෝජනයට ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ). 2013 වර්ෂයට අදාළව වෙළඳ බලපත්‍ර ලබාගෙන, පාරිසරික ආරක්ෂන ලබපත්‍ර ලබාගෙන නොතිබුණු නේවාසික හෝටල්, ආගන්තුක ලැඟුම්හල් ගරාජ හා ඇඹරුම්හල් වැනි පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතුවන ව්‍යාපාර වර්ග 11කට අයත් කර්මාන්ත/ ක්‍රියාවලි වෙනුවෙන් ඒවා පවත්වාගෙන යන පුද්ගලයින්ට විරුද්ධව 2000 අංක 53න් සංශෝධිත ජාතික පාරිසරික පනතේ 23 'අ' වගන්තියට අනුව නීතිමය පියවර ගෙන නොතිබුණි.

3.4 වාහන පාලනය

------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). නාගරික කොමසාරිස්ගේ නිල රථය ලෙස වෙන්කරදී ඇති වාහනය සඳහා රාජකාරි කටයුතු වෙනුවෙන් ලබාදීමට තීරණය කර තිබුණ මසකට ඉන්ධන ලීටර් 140 සීමාව ඉක්මවා 2013 අප්‍රේල් මාසයේ සිට දෙසැම්බර් දක්වා ඉන්ධන ලීටර් 2262ක් ලබාදී ඒ වෙනුවෙන් රු.274,335ක් වැය කර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලයට තුළ නගර සභා සීමාවෙන් පිටත පිහිටි කොළඹ, මහනුවර, මීගමුව, වැල්ලවාය වැනි නගරවලට අවස්ථා 16කදී නාගරික මන්ත්‍රීවරුන් විසින් සභාවේ රාජකාරි නොවූ කාර්යයන් සඳහා වාහන ධාවනය කර තිබුණි.

(ඇ). මහා නගර සභාවට විදේශාධාර යටතේ ගිනි නිවීමේ කාර්යයන් සඳහා ලබාදී ඇති වාහන 04ක් පුරුද්දක් ලෙසට සභාවේ එදිනෙදා රාජකාරි කටයුතු සඳහා යොදාගන්නා බව අනාවරණය වූ අතර ඇතැම් අවස්ථාවලදී සභා බලප්‍රදේශයෙන් පිටත දිනකට වැඩි කාලයක් බැහැර රාජකාරීන් සඳහාද මෙම ගිනිනිවීම් ඒකකයේ වාහන යොදවා තිබුණි.

3.5 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

------------------------------------------

(අ). මහා නගර සභා බලප්‍රදේශයේ මාර්ග ව්‍යාපෘති කඩිනමින් නිමකිරීමට හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා රු.2,565,000ක් වැයකර මිලදීගත් කොන්ක්‍රීට් අර්ධකව 500න් 2013 ජුනි 06 දින භෞතික පරීක්ෂණ අවස්ථාව වන විට 119ක තොගයක් ගබඩාවේද, ඒකක 05ක් පමණ නිමකළ කර්මාන්ත අසලද තිබුණි.

(ආ). 2011 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව වෙන්දේසි කිරීමට නිර්දේශ කර තිබූ යතුරු පැදි 02ක් හා වර්ග 07කට අයත් උපකරණ 29ක් 2014 මාර්තු 31 වෙනි දින වනවිටද වෙන්දේසි කිරීමට හෝ කිසිදු වෙනත් ප්‍රයෝජනයකට හෝ නොගෙන නිශ්කාර්යව තිබුණි.

3.6 හඳුනාගත් අලාභ

-------------------

(අ). සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවූ නිලධාරීන් දෙදෙනෙකුට ගෙවා තිබූ රු.128,104ක ආපදා ණය මුදල ඔවුන් විශ්‍රාම ගැන්වීමේදී රජයට අයවිය යුතු සියළු ණය මුදල් අයකරගෙන නිදහස් නොකිරීම නිසා මහා නගර සභා අරමුදලට එම ප්‍රමාණයෙන් පාඩුවක් සිදුවී තිබුණි.

(ඇ). වාහන සඳහා ආදායම් බලපත්‍ර වාර්ෂිකව ලබාගැනීමට කටයුතු නොකිරීම නිසා සභාව සතු වාහන 03ක් සඳහා 2013 වර්ෂයේදී රු.15,619ක දඩ මුදලක් ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය.

------------------

(අ). සමාලෝචිත වර්ෂය සඳහා අනුමත අයවැය ලේඛණයේ ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා වැය ශීර්ෂ 02ක රු. 8,401,807ක වියදම් දරා ඇතත් ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ආ). ආදායම් ශීර්ෂ 06කට අයත් උප විෂයයන් 24ක් සඳහා අයවැයගත කළ රු.8,568,250ක් වූ ආදායම් අයවීමේ ප්‍රතිශතය සියයට 0ක් විය.

(ඇ). අයවැයගත නොකළ ආදායම් ශීර්ෂ 03කට අයත් උප අය විෂයයන් 03ක රු.566,466ක්වූ ආදායම් උපයාගෙන තිබුණි.

(ඈ). අයවැයගත ආදායම් ශීර්ෂ 03 කට අයත් උප අය විෂයයන් 04 ක සියයට 71 සිට සියයට 95 දක්වා පරාසයක ඉලක්කගත ආදායම් උපයාගැනීමට සමත්වී නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 02ක සියයට 14 සිට සියයට 86 දක්වාද වියදම් විෂයයන් 08ක සියයට 14 සිට සියයට 93 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

--------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 29කට පිළිතුරු සපයා නොතිබුණි.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සභාවේ මිලදීගැනීම් හා ඉදිකිරීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

4.4 විගණනය හා කළමනාකරණ කමිටු පැවැත්වීම

---------------------------------------------------

ආයතනය තුළ විගණනය හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

4.5 අභ්‍යන්තර විගණනය

-----------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). අභ්‍යන්තර පාලනය
(ආ). ආදායම් පරිපාලනය
(ඇ). වත්කම් කළමනාකරණය
(ඈ). ණයගැති ණයහිමි පාලනය.
(ඉ). තොග පාලනය.